# 01. හැඳින්වීම

## 1.1 පසුබිම

| | |
|---|---|
| පළාත | - සබරගමුව |
| දිස්ත්‍රික්කය | - රත්නපුර |
| දේශගුණික තත්වය | - තෙත් හා අන්තර් මධ්‍ය දේශගුණය |
| භූමි ප්‍රමාණය | - වර්ග කිලෝ මීටර් 204 |
| ජනගහනය | - 54928 |
| අයත්වන ප්‍රදේශය | - කොලොන්න කෝරලේ කොලොන්න ගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව |
| කාර්යාලයේ ආරම්භය | - 1949.07.01 ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයක් ලෙස |
| දුරකථන අංකය | ( 0452260238 ) |
| ෆැක්ස් අංකය | ( 0452260237 ) |
| වෙබ් ලිපිනය | - www.kolonna.ds.gov.lk |

DSKOLONNA

රත්නපුර දිස්ත්‍රික්කයේ ගිණිකොන දිග කෙලවරේ පිහිටා ඇති කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුඩා ගම්මාන 144 කින් හා ග්‍රාම නිලධාරි වසම් 29 කින් සමන්විත වේ. දේශගුණික වශයෙන් තෙත් හා අන්තර් මධ්‍ය කලාපයට අයත්ය. කොට්ඨාසයේ බටහිර මායිමේ සිංහරාජ වනාන්තරය පිහිටා ඇති අතර ඒ ආශ්‍රිතව ආරම්භ වන ඇඹිලිපෝරුව ගඟ මෙම කොට්ඨාසය හරහා යන ප්‍රධාන ගංගාවක් ද වේ. මීට අමතරව ප්‍රධාන ගංගාවක් ලෙස වෙලේවතු ගඟ හා හුලංදා ඔය හැඳින්වීමට පුළුවන. එසේම දකුණු පළාතේ මාතර හා ගාල්ල දිස්ත්‍රික්කය හරහා ගලායන ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා 02 ක් වන ගිංගඟේ හා නිල්වලා ගඟේ ආරම්භක දිය බෙත්ම මෙම කොට්ඨාසයට අයත් වන ගොංගල කඳු ශිඛරයයි.

ඓතිහාසික වශයෙන් වැදගත් වන මඩුවන්වෙල වලව්වත්, ස්වභාවික පරිසරයේ දායාදයන් වන වවුල්පන හුණුගල් ගුහාවත් නිසා මෙම ප්‍රදේශය මෙරට පමණක් නොව දෙස් විදෙස් වල පවා අවධානයට ලක් වී ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයේ දුෂ්කරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින් එකක් ලෙස සැලකෙන කොලොන්න කොට්ඨාසය රත්නපුර නගරයේ සිට කි.මී 106 පමණ දුරකින් පිහිටා ඇත. කොට්ඨාසයේ ජනතාව මේ වන විට නවීන තාක්ෂණික මෙවලම් සමග ගැටෙමින් ජාතික නිෂ්පාදනය වැඩි කිරිමට උරදෙමින් සිටී. එසේම උල්ලිඳුවාව, බොරළුවගේඅයින, බුත්කන්ද, ඉත්තකන්ද, බුළුතොට, රංහොටිකන්ද, හේනැග්ගේගොඩ, කොප්පකන්ද, දාපනේ, මොරවාඩිය යන වසම් වල තේ වගාව සාර්ථකව සිදු කරන අතර අනෙකුත් වසම් වල සුළු අපනයන භෝග වන කුරුඳු හා ගම්මිරිස් වගාව සාර්ථකව සිදු කෙරේ. කොලොන්න, මඩුවන්වෙල, නන්දනගම,

ඇරැපෝරුව,බුළුතොට යන වසම් වල සුළු අපනයන බෝග වගාවට අමතරව කුඹුරු වගාව ද සිදු කෙරේ. බොහෝ පිරිසකගේ ජීවනෝපාය මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තයයි.

## දේශගුණය හා වර්ෂාපතනය

තෙත් හා අන්තර් මධ්‍ය දේශගුණ ලක්ෂණ දක්නට ලැබෙන කොලොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඇතැම් ප්‍රදේශවල හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවතින ශුෂ්ක දේශගුණික ලක්ෂණ ද දක්නට ඇත. කොට්ඨාසයේ බටහිර දකුණ මායිම් වලට අයත් වන සමහර කොටස් උස් මධ්‍ය දේශගුණයට අයත් වේ. ග්‍රාම නිලධාරි වසම් වශයෙන් ගතහොත් ඉත්තකන්ද, බුළුතොට, උල්ලිදූවාව ආදි වසම් වල ශිත දේශගුණයක් පවතී. මෙම ප්‍රදේශයේ දේශගුණික වෙනස් වීම් වලට බලපා ඇත්තේ බටහිර මායිමේ පිහිටා ඇති සිංහරාජ වනාන්තරයයි. වසරේ වැඩි කාලයක් පුරා නිරන්තරයෙන් වර්ෂාව මෙම ප්‍රදේශ වලට ලැබේ.

එහෙත් බුළුතොට කඳුකරයේ පහල කොටසට වලකඩ, හබ්බෙලිආර, කැම්පනේ ආදී පහත් බිම් ප්‍රදේශවල හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවතින ශුෂ්ක දේශගුණික ලක්ෂණද දක්නට ලැබේ. මෙයට හේතු වී ඇත්තේ භූගෝලිය වශයෙන් පිහිටීමත් නූතනය වන විට ඇති වී ඇති පාරිසරික වෙනස් වීමය.

## ජල සම්පත්

කොලොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ බටහිර හා දකුණු මායිම් අවශ්‍ය තරම් ජල මාර්ගවලින් පොහොසත්ය. එහෙත් බුළුතොට හෙල්වැටි වල පහල කොටසත් කැල්ල අලගල්කන්ද හබ්බෙලිආර ආදි පහත් බිම් වලට ජලය අවශ්‍ය කරන ප්‍රමාණයට නොලැබේ. මෙහි කුඩා වැව් 04 ක් පමණ පිහිටා ඇත. ඒවා නම් රතඹලා වැව, මඩුවන්වෙල වැව, වෑ කුඹුර වැව හා කටු වැව ආදියයි.

ගංගා වශයෙන් ඇරැපෝරුව ගංහාවත්, වෙලේවතුගොඩ ගහත් කොට්ඨාසයේ තරමක් ජලයෙන් පෝෂණය කරමින් ගලා බසී. වර්ෂාව ලැබෙන කාලවල දී විශාල වශයෙන් ජල පහරවල් ගලා ගියද ඒවා වැසි නැති නියං කාලයේදී මල දොළවල් බවට පත්වේ. කොට්ඨාසයේ පවතින ජල මාර්ග පහත දැක්වේ.

| ග්‍රාම නිලධාරි වසම | ජල මාර්ගය |
| --- | --- |
| බුළුතොට | බුළුතොට ඔය |
| විජේරිය | විජේරිය ගඟ |
| ඇරැපෝරුව | ඇරැපෝරුව ගඟ හේන ඇල්ල |
| පුපුලකැටිය | මකුළුතොට ගඟ කැලිකන්ද ජල උල්පත |
| වලකඩ | වලකඩ ඔය |
| නන්දනගම | දූලි ඇල්ල අරළු ඇල්ල |
| කුඹුරුගමුව | දේදුනු ඇල්ල වවුල්පන කිවුල් දිය උල්පත |

| | |
|---|---|
| කොප්පකන්ද | ඉත්තෑහේන දිය උල්පත |

## පස

මෙම කොට්ඨාසයේ ප්‍රධාන වශයෙන් පස් දෙවර්ගයක් දක්නට ලැබේ. කොට්ඨාසයේ පහල කොටසේ රතු පස දක්නට ලැබෙන අතර බුළුතොට, අලගල්කන්ද, දඩයම් කන්ද, ඉත්තෑකන්ද, උල්ලිඳූවාව ආදි ප්‍රදේශ මෙයට අයත් වේ. එහෙත් රතු දුඹුරු පස පුපුලකැටිය, අඹගහඋල්පත, වලකඩ, ඌරාවල, කරගහයාය යන ප්‍රදේශවල දක්නට ලැබෙන අතර එය පදනම් කරගෙන වී වගාව හා අතිරේක භෝග වගාවන් ස්ථානගත වී ඇත. වැඩි වශයෙන් ජනාවාස ස්ථානගත වී ඇත්තේ මේ ආශ්‍රිතවය.

## ඛනිජ සම්පත්

කොට්ඨාසය පුරාම ඛනිජ සම්පත් දක්නට ලැබෙන අතර මැණික්, හුණුගල්, මිනිරන්, කළුගල්, කාර්මික මැටි ආදිය ප්‍රධාන තැනක් ගනී . පහත දැක්වෙන්නේ ඛනිජ සම්පත් කොට්ඨාසය පුරා පැතිරී ඇති ආකාරයයි.

| <u>ග්‍රාම නිලධාරි වසම</u> | <u>ඛණිජ වර්ගය</u> |
|---|---|
| බුළුතොට | මැණික් /මිණිරන් |
| රංහොටිකන්ද | පදියම්/මිණිරන් |
| විජේරිය | හුණුගල්/ මිණිරන් |
| පොද්දන | මිණිරන් |
| ඇරැපෝරුව | මැණික් /මිණිරන් |
| යක්මඩිත්ත | මැණික් /මිණිරන් |
| මඩුවන්වෙල | මැණික් /කළුගල් /මිණිරන් |
| නන්දනගම | මැණික් |
| කුඹුරුගමුව | මැනික්/ හුණුගල් / මිණිරන් |
| දඹේමඩ | හුණුගල්/මිණිරන් |
| වෙලේවතුගොඩ | මැණික් / හුණුගල් / මිණිරන් |
| ඕමල්පේ | මිණිරන් |
| කැල්ල | කාර්මික මැටි |

DSKOLONNA

DS KOLONNA